# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,417 - 2024 දෙසැම්බර් මස 27 වැනි සිකුරාදා - 2024.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| කනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බදුබාහිරාදිය විනිශ්චය ... ... | 5694 |
| පළාත් පාලන නිවේදන ... ... | 5694 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලනන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විනිශ්චය ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 5749 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව ඔබේ අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. කනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම් සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව ටයිප් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් යන පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 17 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2025 ජනවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තේ සේ සැලකිය යුතු ය."

2024 දෙසැම්බර් 25 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**දීපා නිලන්ති ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

5693 - B 082641 — 5,403 (2024/12)
F 1 -

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 134(3) වැනි උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව අක්කර බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 දින තීරණ අංක 19 යටතේ ගන්නාට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,<br>
ලේකම්,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර් යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර බද්දට යටත් සෑම ඉඩමක 2024 වර් ෂයේදී බලාත්මක වූ තක්සේරුව 2025 වර්ෂයේ තක්සේරුව ලෙස පිළිගැනීමට,

(ආ) 134 වන වගන්තියේ (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, එකී උපවගන්තියේ පළමු අතුරු විධානය යටතේ 1989.03.10 දිනැති *ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයකින් අක්කර බද්ද නියම කිරීමේ සහ අය කිරීමේ කාර්යය සඳහා පළාත් පාලන අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශයේ පිහිටි හෙක්ටයාර එකකට නොඅඩු එහෙත් හෙක්ටයාර පහකට අඩු සෑම ඉඩමක් මත රුපියල් පනහක (50.00) අනුප්‍රමාණය අනුව වූ අක්කර බද්දක් සහ හෙක්ටයාර 05 ක් හෝ ඊට වැඩි සෑම ඉඩමක සෑම හෙක්ටයාරයක් මත රුපියල් දහය (10.00) බැගින් වූ අක්කර බද්දක් 2025 වර් ෂයේ පනවා අය කිරීමට, සහ

(ඇ) 134 වන වගන්තියේ (6) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත බද්ද 2025 වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දින වලින් අවසන් වන කාර්තු හතර තුලදී සමාන වාරික හතරකින් (04) ප්‍රාදේශීය සභාවට ගෙවන ලෙස බද්දට යටත් වන තැනැත්තෙකුට විධාන කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තීරණය කරමි.

(ඇ) 2025 වර් ෂය සඳහා වන සම්පූර් ණ අක්කර බද්ද 2025 වර් ෂයේ ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර් ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, එක් එක් කාර් තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

උපලේඛනය

| *කාර්තුව* | *ගෙවිය යුතු දිනය* | *5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය* |
|---|---|---|
| පළමු වන කාර්තුව | 2025.01.01-2025.03.31 | 2025.01.31 |
| දෙවන කාර්තුව | 2025.04.01-2025.06.30 | 2025.04.30 |
| තුන්වන කාර්තුව | 2025.07.01-2025.09.30 | 2025.07.30 |
| හතරවන කාර්තුව | 2025.10.01-2025.12.31 | 2025.10.31 |

12 - 443/2

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් , පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි උප වගන්තිය හා 148 වැනි වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව වාහන හා සතුන් පිළිබඳව බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර් යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමඟ කියවියයුතු එකී පනතේ 148 වන වගන්ති සහ 4 වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2025 වර්ෂයේදී පහත උපලේඛනයේ I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකු මතම උපලේඛනයේ II වන තීරුවේ අනුරූපින සටහනෙහි නිරූපිත බද්දක් 2025 වර්ෂයේදී පනවා අය කිරීමට තීරණය කරමි.

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව රු. ශත* |
|---|---|
| මෝටර් රථයක්, මෝටර් කාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා කාර්තුවකට :<br><br>සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල්, කාරයක් හෝ කරත්තයක් සඳහා :- | 25.00 |
| (අ) වෙළඳ කාර්යය සඳහා යොදවන්නේ නම් | 18.00 |
| (ආ) වෙළඳ කාර්යය නොවන කාර්යය සඳහා යොදවන්නේ නම් | 4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත්කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයකු, පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | 15.00 |
| සෑම ඇතකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත්කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

(මේ උපලේඛනයේ "වෙළඳ කාර්යය" යන්නට, විකිණීම සඳහා හෝ අනාකාරයකින් හෝ යම් වෙළඳ ව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූ යම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙනයාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුළත් වේ.

12 - 443/3

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නාට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර් යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 147 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් 2025 වර්ෂයේදී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වන තීරුවේ නිරූපිත යම් සීමාවක් ඇතුලත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුප්‍රමාණ අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අය කළයුතු යැයි රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තීරණය කරමි.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන්පළක් වන විටදී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2024 වර්ෂයේ ලැබීම්වලින් 1% ක් බලපත්‍ර ගාස්තුව ලෙස ගෙවිය යුතු බවටත් වෙළඳ බලපත්‍ර ගාස්තු 2025 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙරත් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙත ගෙවිය යුතු බවටත් තීරණය කරමි.

### උප ලේඛනය - I

*අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් :*

| *අනු අංකය* | ***I** තීරුව* *බලය දෙනු ලබන කාර්යය* | ***II** තීරුව* *පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | ***රු. 750.00*** *නොඉක්මවන අවස්ථාවක* | ***රු. 751.00*** *ඉක්මවන එහෙත්* ***රු.1500.00*** *නොඉක්මවන අවස්ථාවක* | ***රු. 1501.00*** *ඉක්මවන අවස්ථාවක* |
| 1. | වායු සමීකරණ යන්ත්‍ර, ශීතකරණ, අධිශීතකරණ, සේවා කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | බැටරි චාර්ජ් කිරීමේ මධ්‍යස්ථානය | 500.00 | 750.00 | 1000.00 |
| 3. | ඇඹුල්/ සුවඳ විලවුන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ස්වර්ණාභරණ නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 5. | ඔරලෝසු අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ගුවන් විදුලි යන්ත්‍ර/ රූපවාහිනී හා විදුලි උපකරණ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 7 | කුකුළු හා ඌරු ගොවිපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | එළවළු හා පලතුරු අලෙවිය | | | |
| 9 | විජලනය කරන ලද පලතුරු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

| අනු අංකය | I තීරුව<br>බලය සඳහා ලබන කාර්යය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | *රු. 750.00*<br>නොඉක්මවන අවස්ථාවක | *රු. 751.00*<br>ඉක්මවන එහෙත් *රු.1500.00*<br>නොඉක්මවන අවස්ථාවක | *රු. 1501.00*<br>ඉක්මවන අවස්ථාවක |
| 10. | පුපුරණ ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ගෑස් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | සබන් නිෂ්පාදනය/ පිරිසිදු කිරීමේ ද්‍රව්‍යය නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 13. | සින්තූර රාමු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | සේ හොළ නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 15. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 17. | විද්‍යුත් ලෝහ ආලේපනය | 500.00 | 750.00 | 1000.00 |
| 18. | ටයර් ටියුබ් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | දැව කැබලි කිරීමේ කර්මාන්තයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | යාන්ත්‍රික වඩුමඩුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | යාන්ත්‍රික ලී මෝලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | ලේත්/වෙල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 27 | කම්මලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | සුරුට්ටු හා බීඩි නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | පාපැදි, යතුරු පැදි, ත්‍රීරෝද රථ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 30 | වාහන සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 31. | බ්‍රේක් ලයිනර් අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 32. | ඩීසල් පොම්ප අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 33. | ප්‍රචාරක දැන්වීම් පුවරු හා වෙනත් දැන්වීම් ආදිය මුද්‍රණය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | පෞද්ගලික දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | අත් යන්ත්‍ර මගින් රබර් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | පොල් තෙල් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 40. | කළුගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | වාහන පින්තාරු කිරීම හා ලොරි බොඩි තැනීම | 500.00 | 750.00 | 1000.00 |

| අනු අංකය | I තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | *රු. 750.00*<br>*නොඉක්මවන අවස්ථාවක* | *රු. 751.00*<br>*ඉක්මවන එහෙත් රු.1500.00 නොඉක්මවන අවස්ථාවක* | *රු. 1501.00*<br>*ඉක්මවන අවස්ථාවක* |
| 42. | ගඩොල් පෝරණුවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | කෘෂි රසායන හා පොහොර නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 45. | හුණු ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46 | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | රබර් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 48. | ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 49. | සම්භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 50. | බිම්මල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 51. | රේඩියේටර් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 52. | කොළ කැඳ අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 53. | පානීය ජලය බෝතල් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 54. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 55 | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 56. | උත්සව අවස්ථාවන් සඳහා ආහාරපාන සැපයීම | 500.00 | 750.00 | 1000.00 |
| 57. | හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 58. | ලෝහ භාණ්ඩ නිෂ්පාදනය හා එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 59. | පොටි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 60. | තුනී ලැලි / ප්ලයිවුඩ් ලැලි නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 61. | ගම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 62. | වැලි ගොඩ දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 63. | පපඩම් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 64. | කරවල නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 65. | මස් ප්‍රවාහනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 66. | ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 67. | පටක රෝපණ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 68. | ටයිල් ග්‍රවුට් සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 69. | ටයිල් කපන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 70. | කාර්ටන් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 71. | කුළුබඩු නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 72. | වයරින් කිරීම හා අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 73. | වීදුරු බෝතල් පිරිසිදු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 74. | ඉවතලන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අලෙවි කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 75. | විද්‍යාගාර උපකරණ රසායනික ද්‍රාවණ සහ උපාංග ආදිය අලෙවිය හා බෙදාහැරීම | 500.00 | 750.00 | 1000.00 |

උප ලේඛනය- II

*වෙනත් ව්‍යාපාර හෝ කර්මාන්ත :*

| *අනු අංකය* | ***I** තීරුව*<br>*බලය දෙනු ලබන කාර්යය* | ***II** තීරුව*<br>*පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. **750.00** නොඉක්මවන අවස්ථාවක* | *රු. **751.00** ඉක්මවන එහෙත් රු.**1500.00** නොඉක්මවන අවස්ථාවක* | *රු. **1501.00** ඉක්මවන අවස්ථාවක* |
| 1. | තේ කඩ /කෝපි කඩ,ආපන ශාලා ,බත් කඩ පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | හෝටලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | බේකරියක් පවත්වාගෙන යාම/ කේක් හා රසකැවිලි නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | ආහාර වර්ග විකිණීම/බයිට් වර්ග /පාට් සැලඩ්/ක්ෂණික ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 5. | සිසිල් බීම නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 6. | අයිස් ක්‍රීම් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 7. | මාළු වෙළඳම හා ශීතකල මාළු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | මස් වෙළඳම හා ශීතකල මස් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 9. | ලැහුම්හලක් හා රෙස්ටුරන්ට් ශාලාවක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ගව පට්ටියක් හා කිරි අලෙවිය/ කිරිහලක් පවත්වාගෙන යාම/ කිරි ආශ්‍රිත නිෂ්පාදන අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ඝාතන මඩු පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | සංචාරක වෙළදාම | 500.00 | 750.00 | 1000.00 |

12 - 443/4

---

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

2025 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් , පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 150(1) වැනි උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නාව යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,<br>
ලේකම්,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර,

(අ) රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත යම් පරිශ්‍රයක පවත්වාගෙන යනු ලබන මෙහි පහත උප ලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයෙහි II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2025 වර් ෂය සඳහා පනවා අය කිරීමට තීරණය කරමි.

*උපලේඛනය*

| අනු අංකය | I තීරුව<br>කර්මාන්තය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | **රු.750.00**<br>නොඉක්මවන අවස්ථාවක | **රු.751.00**<br>ඉක්මවන එහෙත් **රු.1500.00**<br>නොඉක්මවන අවස්ථාවක | **රු.1501.00**<br>ඉක්මවන අවස්ථාවක |
| 1. | කැටයම් කැපිමේ කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 2. | කොසු, ඉදල්, පාපිසි නිෂ්පාදනය කිරීමේ කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 3. | යාන්ත්‍රික රෙදි විවීම හා අත් යන්ත්‍ර මගින් රෙදි විවීමේ කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 4. | දේශීය අමුද්‍රව්‍ය යොදාගෙන අත්කම් නිර් මාණ නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 5. | රෙදිපිළි පිළිසකර කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | කිතුල් ආශ්‍රිත නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | කිතුල් ලී , පොල්කටු ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | පාවහන් නිපදවීම හා අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |
| 9. | මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | මෙට්ට නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 11. | හඳුන්කූරු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 12. | යාන්ත්‍රික නොවන වඩු කර්මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 13. | ඉටිපන්දම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | වීසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | වාස්තු කර් මාන්තය | 500.00 | 750.00 | 1000.00 |
| 17. | රබර් වෙලන දුම්ගෙයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 18. | සත්ත්ව  ආහාර නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | ලියුම් කවර හා වෙනත් කවර නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | කොහු කෙඳි ආශ්‍රිත නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 21. | යන්ත්‍රානුසාරයෙන් බීරළ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 22. | තල ලිං සැකසීම | 500.00 | 750.00 | 1000.00 |

| අනු අංකය | I තීරුව<br>කර්මාන්තය | II තීරුව<br>පරිශ්‍රයෙහි වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු.750.00<br>නොඉක්මවන<br>අවස්ථාවක | රු.751.00<br>ඉක්මවන<br>එහෙත්<br>රු.1500.00<br>නොඉක්මවන<br>අවස්ථාවක | රු.1501.00<br>ඉක්මවන<br>අවස්ථාවක |
| 23. | බැග් මැසීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | මදුරු දැල් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 25. | කඩදාසි නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 26. | කලර් සිමෙන්ති සැකසීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | පහන් තිර නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 28. | ඇලුමිනියම් / ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 29. | පෙනේර, බාල්දි , කිරිගොටු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |

12 - 443/5

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්, සී.ආර්.සතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 152(1) වැනි උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම් සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

සී.ආර්.සතිරණ,<br>
ලේකම්,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වන වගන්තියේ,

ආ) (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වන වගන්තිය ප්‍රකාරව බලපත්‍ර ගාස්තුවකට හෝ එකී පනතේ 150 වන වගන්තිය ප්‍රකාරව කර්මාන්ත බද්දට යටත් නොවන්නාවූ යම් ව්‍යාපාරයක් රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත 2025 වර්ෂයේදී පවත්වාගෙන යන සෑම තැනැත්තෙක්ගෙන්ම එම ව්‍යාපාරයේ 2024 වර්ෂයේ ආදායම් මෙහි පහත උපලේඛනයෙහි I වන තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුලත පවතින අවස්ථාවක එකී II තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2025 වර්ෂය සඳහා නියම වියයුතු බවටත්,

(ආ) (3) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් යථෝක්ත බද්ද 2025 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි නියම කිරීමට තීරණය කරමි.

**උපලේඛණය**

| I තීරුව | II තීරුව |
|---|---|
| 2024 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම | රු. ශත |
| රු.6,000 නොඉක්මවන අවස්ථාව | කිසිවක් නොමැත |
| රු.6,001 ඉක්මවන එහෙත් රු.12,000 නොඉක්මවන අවස්ථාවක | 90.00 |
| රු.12,001 ඉක්මවන නමුත් රු.18,750 නොඉක්මවන අවස්ථාවක | 180.00 |
| රු.18,751 ඉක්මවන නමුත් රු.75,000 නොඉක්මවන අවස්ථාවක | 360.00 |
| රු.75,001 ඉක්මවන නමුත් රු.150,000 නොඉක්මවන අවස්ථාවක | 1200.00 |
| රු.150,001 ඉක්මවන අවස්ථාවක | 3000.00 |

12 - 443/6

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් , පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගගන්තිය සමග කියවිය යුතු එම පනතේ 153(1) වැනි උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව සංවර්ධනය නොකල ඉඩම් මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නාව යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,<br>
ලේකම්,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,<br>
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර් යාලයේ දී ය.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති සංවර්ධනය නොකළ ඉඩම් සඳහා එම ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට 0.5% වන බද්දක් 2025 වර්ෂය සඳහා පනවා අයකළයුතු බවටත්, එම බද්දේ කාර්යය සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1)(ආ) ඡේදය යටතේ වන "සමානුපාතය" වශයෙන් එම ඉඩම ගොඩනැගිලිවලින් ආවරණය වූ බිම් ප්‍රමාණය සහ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර අනුපාතය 1:5 වියයුතු යැයි නියම කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තීරණය කරමි.

12 - 443/7

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## 2025 වර්ෂය සඳහා පෝරම් ගාස්තු හා වෙනත් සේවා ගාස්තු අය කිරීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. ආර්. පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) වැනි උපවගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2025 වර්ෂයට අදාළව පෝරම් ගාස්තු හා වෙනත් සේවා ගාස්තු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් 2025 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පහත ආකාරයට පෝරම් ගාස්තු හා වෙනත් සේවා ගාස්තු පැනවීමට තීරණය කරමි.

| | | *රු.ශත* |
|---|---|---|
| 01. | වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික පත්‍ර ගාස්තු | 1,500.00 |
| 02. | වීථි රේඛා සහ නොපවරා ගැනීමේ සහතික අයදුම්පත්‍ර ගාස්තු | 200.00 |
| 03. | අනුකූලතා සහතික ඉල්ලුම් පත්‍ර ගාස්තු අය කිරීම | 200.00 |
| 04. | ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | |
| | නාගරික | 1,000.00 |
| | නාගරික නොවන | 750.00 |
| 05. | ඉඩමේ සැලස්ම අනුමත කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු | |
| | නාගරික | 1,000.00 |
| | නාගරික නොවන | 500.00 |
| 06. | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තු | |
| | කොස් ගස් හා බලපත්‍ර ලබා ගත යුතු අනෙකුත් ශාක කැපීම | 2,000.00 |
| | කොස් ගස්නොවන | 1,000.00 |
| 07. | වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව | 200.00 |
| 08. | වරිපනම් වාර්තා නිකුත් කිරීමේ ගාස්තුව | 500.00 |
| 09. | වරිපනම් බදු ගෙවන බවට සහතික නිකුත් කිරීම සඳහා ගාස්තුව | 500.00 |
| 10. | නව වරිපනම් අංක නිකුත් කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු | 200.00 |
| 11. | නව වරිපනම් අංක නිකුත් කිරීමේ ගාස්තුව | 1,000.00 |
| 12. | වරිපනම් ලේඛනයේ නම සංශෝධනයට තක්සේරු දෙපාර්තමේන්තුවට යැවීමේ ගාස්තු | 1,000.00 |
| 13. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශය ලබා ගැනීමේ අයදුම්පත්‍ර ගාස්තු (බී.ඒ. අයදුම්පත්‍රය) | 100.00 |
| 14. | යන්ත්‍ර සූත්‍ර හා වාහන කුලියට දීම | |
| | * කම්පන තලනය (ලෙලෙන තලනය ටොන් 1 ½ ) පැය 8 ක දිනකට (වාහන කුලි ඉන්ධන සේවා වැටුප් සමග) | රු. 11,000.00 |
| | * බැකෝ ලෝඩරය (JCB) මීටර් පැය එකක ගාස්තුව **(අවම මීටර් පැය 2 කට ගාස්තුව අය කළ යුතුය.)** | රු.5,500.00 |
| | * මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලී පදනම මත ලබාදීමේ දී මීටර් පැය 06 කට අඩු ඕනෑම කාලසීමාවක් සඳහා (මීටර් පැය 06 දක්වා ) ගාස්තුව පැයකට | රු.6,500.00 |
| | (පැය 06 ක් සඳහා (6,500.00x6) | රු.39,000.00 ක් වේ. ) |

* පැය 06 කට වැඩිවන අවස්ථාවලදී මීටර් පැයකට ගාස්තුව රු.6000.00 ක් වේ.

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉල්ලුම් කරන උපරිම දින 10 ක් සඳහා එම ඉල්ලුම් කරන දිනට අමතරව එක් දිනකට ගාස්තුව ගෙවිය යුතුය.

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය ඉල්ලුම් කරනු ලබන්නේ දින 10කට වඩා වැඩි කාලයක් සඳහා නම් ගිවිසුම් ගත විය යුතුය.

| | |
|---|---|
| * ජලබවුසරය (ලොකු) ලීටර් 6000 (ජලය රහිතව)<br>(රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ) | රු. 8,000.00 |
| රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත | රු. 10,000.00 |

ප්‍රවාහන ගාස්තු වශයෙන් කි.මී. 1 සඳහා යාමට සහ ඒමට රු. 350.00 ක ගාස්තුවක් අය කෙරේ.

රඳවා තබා ගන්නවානම් රඳවා තබා ගන්නා එක් පැයකට රු.1,500.00 බැගින් අයකෙරේ.

* ගලිබවුසරය :

| | | |
|---|---|---|
| 01. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාව තුළ | රු.8,500.00 |
| 02. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් සීමාවෙන් පිටත හා බල ප්‍රදේශයෙන් පිටත | රු.10,000.00 |
| 03. | ප්‍රවාහන ගාස්තු කි. මී.01 යාමට හා ඒමට | රු.200.00 |
| 04. | ඉදල්ගොල මලාපවහන පද්ධතියට බැහැර කිරීම සඳහා ගාස්තුව බල ප්‍රදේශයෙන් පිටත | රු.2,000.00 |
| | බල ප්‍රදේශය තුළ මුදල් අය නොකෙරේ. | |
| 05. | රාජ්‍ය ආයතන සඳහා | රු.2,000.00 |
| 06. | රාජ්‍ය නොවන ආයතන සඳහා<br>බල ප්‍රදේශය තුළ මුදල් අය නොකෙරේ. | රු.2,500.00 |
| 07. | සේවා ගාස්තු | රු.1,000.00 |

| | |
|---|---|
| * ටිපර් රථය සඳහා ගාස්තුව | |
| කියුබ් 03ට අඩු කි.මී.15ට ඕනෑම දුරක් සඳහා | රු.9,000.00 |
| ඊට වැඩිවන සෑම කි.මී. 1 සඳහා යාමට හා ඒමට | රු.400.00 |
| * ප්ලාස්ටික් පුටු - එක් පුටුවක්<br>(නැතිවීමකදී පුටුවක මිල අය කෙරේ) | රු.20.00 |

* කොඩි කණු - එක් කොඩි කණුවක් සඳහා - රු.30.00 කි (එක් දිනක් සඳහා)
(කොඩි කණු ලබා ගැනීමේදී රු. 3,000.00 ක තැන්පතු මුදලක් ගෙවිය යුතුය.)

පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර, නැතිවුවහොත් කණුවක තත්කාලීන වෙළඳ වටිනාකම හා ඉන් 5% ක් අයකෙරේ.)

* බෞද්ධ කොඩි - එක් බෞද්ධ කොඩියක් සඳහා - රු 20.00 කි (එක් දිනක් සඳහා)
(පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවීමකදී හෝ පලුදුවීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

* ජාතික කොඩි -(එක් ජාතික කොඩියක් සඳහා - රු 20.00 කි) (එක් දිනක් සඳහා)
(පූජනීය ස්ථාන, රජයේ ආයතනවලට නොමිලේ සැපයෙන අතර නැතිවීමකදී හෝ පලුදු වීමකදී කොඩියේ වටිනාකම ගෙවිය යුතුය.)

* ෆ්ලෑෂ් ලයිට් එකක් - රු 1,000.00 කි.( එක් දිනක් සඳහා)
(ෆ්ලෑෂ් ලයිට් සඳහා දින තුනකට රු. 1,000.00 ක් බැගින් ද, වැඩිවන සෑම දිනක් සඳහා රු. 200.00 ක් බැගින් අයකෙරේ. බල ප්‍රදේශය තුළ මළගෙවල් හා ආගමික ස්ථානවලට නොමිලේ සැපයේ.)

15. 2025 වර්ෂය සඳහා රුවන්වැල්ල ප්‍රාදේශීය සභා නාගරික නොවන ප්‍රදේශවල මිනින්දෝරු සැලසුම් අනුමත කිරීම, කට්ටි සැලසුම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, කාලය දීර්ඝ කිරීම සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු | | |
|---|---|---|---|
| | ඉඩමේ ප්‍රමාණය වර්ග මීටර | පෙරසැරි ගාස්තු | |
| 1. ඉඩම් අනු බෙදුම් සඳහා | ව.මී.150 - ව.මී.300<br>ව.මී.301 - ව.මී.600<br>ව.මී.601 - ව.මී.900<br>ව.මී.900 වැඩි | රු. 750.00<br>රු. 600.00<br>රු. 450.00<br>රු. 375.00 | |
| 2.ඉඩම් අනු කොටස්වලට බෙදීම | ව.මී.150 -ව.මී.300<br>ව.මී.301 -ව.මී.600<br>ව.මී.601 -ව.මී.900<br>ව.මී.900 ට වැඩි | කැබලි 1ක් සඳහා - රු. 1,000.00<br>කැබලි 1ක් සඳහා - රු. 800.00<br>කැබලි 1ක් සඳහා - රු. 600.00<br>කැබලි 1 ක් සඳහා - රු. 500.00 | |
| 3.මායිම් තාප්ප /රැඳවුම් බැම් ඉදිකිරීම | දික් මීටර් 1ක් සඳහා | රු. 100.00 | |
| 4.සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/ සම්ප්‍රේෂණ කුළුණු ඉදි කිරීම | රු. 40,000.00 | | |
| 5.ඉන්ධන පිරවුම්හල්/වාහන සේවා ස්ථාන/දුම් පරීක්ෂා කරන ස්ථාන | ව.මී.1ක් සඳහා | රු. 100.00 | |
| 6.දැන්වීම් පුවරු | i. ඩිජිටල් දැන්වීම් පුවරු(ව.මී.1ට) | රු. 1,875.00 | |
| | ii. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී.1 ට) | රු. 1,125.00 | |
| | iii. නාම පුවරු (ව.මී.1ට) | රු. 375.00 | |
| | iv. මාර්ගයකට ඉහලින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු(Gertries) ව.මී.1 ට | රු. 750.00 | |
| 7.කසල බැහැර කිරීමේ අංගන/තාවකාලික රැස්කර තබන ස්ථාන/කොම්පෝස්ට් අංගන/සෞඛ්‍යාරක්ෂිතව කසල යොදා ඉඩම් ගොඩකිරීම | හෙක්ටයාර් 1 දක්වා<br><br>හෙක්ටයාර් 1ට වැඩි | රු. 25,000.00<br><br>රු. 250,000.00 වැඩිවන සෑම හෙක්ටයාර් 1 කට හෝ ඉන් කොටසක් සඳහා රු. 5,000.00 බැගින් | |
| 8.නේවාසික හා නේවාසික නොවන ගොඩනැගිලි | ගෙබිම් ප්‍රමාණය(ව.මී.) | නේවාසික (ව.මී.1කට) | නේවාසික නොවන(ව.මී.1කට) |
| | ව.මී.400 දක්වා | රු. 15.00 | රු. 20.00 |
| | ව.මී.401-1000 | රු. 17.00 | රු. 22.00 |
| | ව.මී.1001-1500 | රු. 20.00 | රු. 25.00 |
| | ව.මී.1501-2000 | රු. 20.00 | රු. 27.00 |
| | ව.මී.2000ට වැඩි | වැඩිවන සෑම ව.මී.90ක් සඳහාම රු.1,500.00 බැගින් | වැඩිවන සෑම ව.මී.90ක් සඳහාම රු.1,500.00 බැගින් |

| සංවර්ධන කාර්යයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු | |
|---|---|---|
| | ඉඩමේ ප්‍රමාණය වර්ග මීටර | පෙරසැරි ගාස්තු |
| 9. වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබන<br>i. පිහිනුම් තටාක (තටාකයේ ඩෙක් සමඟ) සහ<br>ii. සූර්ය පැනල සඳහාවන ගාස්තු | වර්ග ප්‍රමාණය (ව.මී.) | ගාස්තුව රු. |
| | ව.මී. 300 දක්වා<br>ව.මී. 301-500<br>ව.මී. 501-1000<br>ව.මී. 1000ට වැඩි | රු. 4,500.00<br>රු. 11,250.00<br>රු. 22,500.00<br>රු. 22,500.00 + වැඩිවන සෑම ව.මී.100 හෝ ඉන් කොටසක් සඳහා රු.1,000.00 බැගින් |
| 10. (i) අනුමත සැලසුමට අමතරව ගෙබිම් ප්‍රමාණය වැඩි වනසේ සිදු කරන වෙනස් කිරීම් හා එකතු කිරීම්<br>(ii) ගෙබිම් ප්‍රමාණය වෙනස් කිරීමක් නොමැතිව අනුමත සැලැස්ම තුල සිදුකරනු ලබන වෙනස් කිරීම් | මුළු පෙරසැරි ගාස්තුවෙන් 25% + වැඩි වන අමතර වර්ග ප්‍රමාණය සඳහා පෙරසැරි ගාස්තුව<br><br>මුල් අනුමැතියේ දී ගෙවන ලද පෙරසැරි ගාස්තුවෙන් 25% | |
| 11. සංවර්ධන බලපත්‍රයක් වෙනත් පාර්ශවයකට පැවරීම | රු.18,750.00 | |
| 12. සංවර්ධන බලපත්‍රයේ වලංගු කාලය වසරකින් දීර්ඝ කිරීම | i.) ව.මී.1000 දක්වා | රු. 3,750.00 |
| | ii) ව.මී. 1000ට වැඩි | රු. 7,500.00 |
| 13. වාහන නැවැත්වීමේ ස්ථාන (පරිශ්‍රය තුළ ලබා දී නොමැති විට එක් එක් වාහන නැවැත්වීමේ ඉඩ සඳහා සේවා ගාස්තු) | සියලුම වාහන සඳහා රු.187,500.00 | |
| 14. රථවාහන නැවැත්වීමේ ඉඩ වෙනත් භාවිතයන් සඳහා භාවිත කිරීම. | එක ඉඩකඩක් සඳහා රු.15,000.00 ක් සහ අනුමත සැලැස්ම පරිදි වාහන නැවැත්වීමට පරිවර්තනය වනතෙක් 10% ක වර්ධනයක් සහිතව | |

16. ආවරණ අනුමැතිය ලබාදීම සඳහාවන සේවා ගාස්තු (පෙරසැරි ගාස්තුවලට අමතරව) :

| සංවර්ධනයේ ස්වභාවය | අයකළ යුතු ගාස්තු (බදු රහිත) | |
|---|---|---|
| 1. අවශ්‍ය අනුමැතිය ලබා නොගෙන සිදු කරන ලද ඉඩම් බෙදීමක් සඳහා | ඉඩම් කැබලි 1ක් සඳහා රු. | |
| අනුමැතියකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම /එකතු කිරීම්/නැවත ඉදිකිරීම් | නේවාසික (ව.මී.1 කට) | නේවාසික නොවන (ව.මී. 1කට) |
| i. අත්තිවාරම් වැඩ පමණක් සම්පූර්ණ කර ඇති විට (කයිරු මට්ටම දක්වා) | රු. 150.00 | රු. 375.00 |
| ii. වහල මට්ටම දක්වා ඉදිකිරීම්, වැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට(වහලය හැර) | රු. 225.00 | රු. 750.00 |
| iii.වහලය සහිත බිත්ති ඉදිකිරීම | රු. 300.00 | රු. 1,125.00 |
| iv.පදිංචිය සඳහා සුදුසු පරිදි ඉදිකිරීම් සම්පූර්ණ කිරීම. | රු. 375.00 | රු. 1500.00 |
| v.මායිම් තාප්ප/රැඳවුම් බිත්ති ඉදිකිරීම | රු. 150.00 | රු. 375.00 |
| vi. විදුලි සංදේශ, සම්ප්‍රේෂණ සහ නිෂ්පාදක ඉදිකිරීම<br>ඇන්ටනා කුළුණු ඉදිකිරීම, වහල මුදුන ඉදිකිරීම | | රු. 112,500.00<br>රු. 75,000.00 |
| 2.අනුකූලතා සහතික (COC) ලබා නොගෙන පදිංචි වීම | | දිනකට රු. 100.00 |

අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු :

| *සංවර්ධන කාර්යයේ ස්වභාවය* | *අයකළ යුතු ගාස්තු(බදු රහිතව)* | | |
|---|---|---|---|
| 1.ඉඩම් අනු බෙදීම් කිරීම | එක් කැබැල්ලකට රු.1,000.00 | | |
| 2.ගොඩනැගිලි ඉදිකිරීම | *ගෙබිම් ප්‍රමාණය (ව.මී.)* | *නේවාසික* | *නේවාසික නොවන* |
| | ව.මී.400 දක්වා | රු.3,000.00 | රු.3,750.00 |
| | ව.මී.400 ට වැඩි | රු.3,000.00 + ව.මී.400ට වැඩිවන සෑම ව.මී.1කටම හෝ ඉන් කොටසක් සඳහා රු.15.00 බැගින් | රු. 3750.00 + ව.මී. 400 ට වැඩිවන සෑම ව.මී. 1 කටම හෝ ඉන් කොටසක් සඳහා රු.25.00 බැගින් |
| 3. සංනිවේදන කුළුණු ,ඇන්ටනා කුළුණු, සම්ප්‍රේෂණ කුළුණු සඳහා | රු. 5000.00 | | |
| 4. මායිම් තාප්ප හා රැඳවුම් බැමි | දික් මීටර් 1 කට රු. 25.00 බැගින් | | |
| 5. පොදු ගොඩනැගිලි සඳහාවන අනුකූලතා සහතික අලුත් කිරීම් | රු. 10,000.00 | | |

17. රුවන්වැල්ල මහජන ක්‍රීඩාංගනය ලබාදීම වෙනුවෙන් දෛනික ගාස්තු අය කිරීම පහත සඳහන් පරිදි වේ.

| *අනු- අංක* | *කාරණය* | *මුදල් අයකිරීම* | | | |
|---|---|---|---|---|---|
| | | *ක්‍රීඩාංගනය සඳහා* | | *වොලිබෝල් ක්‍රීඩාපිටිය සඳහා* | |
| | | *දිවා කාලය පෙ.ව. **7.00** සිට ප.ව. **5.00** දක්වා* | *රාත්‍රී කාලය ප.ව. **6.00** සිට පසුදා පෙ.ව. **6.00** දක්වා* | *දිවා කාලය පෙ.ව. **7.00** සිට ප.ව. **5.00** දක්වා* | *රාත්‍රී කාලය (සම්පූර්ණ ආලෝකය සහිතව) ප.ව. **6.00** සිට පසුදා පෙ.ව. **6.00** දක්වා* |
| 1. | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළ විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් |
| 2. | ක්‍රීඩා අමාත්‍යාංශ (මධ්‍යම/පළාත්) ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු නිදහස් |
| 3. | රුවන්වැල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සහෝදර රාජ්‍ය ආයතනවල විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු නිදහස් තැන්පත් ගාස්තු රු. 5,000.00 |
| 4. | අර්ධ රාජ්‍ය ආයතනවල විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පතු ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 |

| අනු. අංක | කාරණය | මුදල් අයකිරීම | | | |
|---|---|---|---|---|---|
| | | ක්‍රීඩාංගනය සඳහා | | වොලිබෝල් ක්‍රීඩාපිටිය සඳහා | |
| | | දිවා කාලය පෙ.ව. **7.00** සිට ප.ව. **5.00** දක්වා | රාත්‍රී කාලය ප.ව. **6.00** සිට පසුදා පෙ.ව. **6.00** දක්වා | දිවා කාලය පෙ.ව. **7.00** සිට ප.ව. **5.00** දක්වා | රාත්‍රී කාලය (සම්පූර්ණ ආලෝකය සහිතව) ප.ව. **6.00** සිට පසුදා පෙ.ව. **6.00** දක්වා |
| 5. | රුවන්වැල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා සමාජ, යොවුන් සමාජ, මගින් සංවිධානය කරනු ලබන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු- රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු රු. 10,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 |
| 6. | රුවන්වැල්ල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් පිටත සහෝදර රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතන සඳහා හා ක්‍රීඩා සමාජ, යොවුන සමාජ වැනි සංවිධාන වල ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු රු. 10,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 |
| 7. | දෙහිඕවිට අධ්‍යාපන කලාපයෙන් පිටත පාසල් හා අධ්‍යාපන කාර්යාලවල විශේෂ ක්‍රීඩා වැඩසටහන් සඳහා | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 8,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු රු. 5,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 |
| 8. | පුද්ගලික ආයතන මගින් සංවිධානය කරන විශේෂිත ක්‍රීඩා වැඩසටහන් | දෛනික ගාස්තු රු. 20,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 25,000.00 තැන්පත් ගාස්තු රු. 10,000.00 | දෛනික ගාස්තු රු. 10,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 | දෛනික ගාස්තු රු. 10,000.00 තැන්පත් ගාස්තු රු. 5,000.00 |

| අනු. අංකය | කාරණය | මුදල් අය කිරීම | | |
|---|---|---|---|---|
| | | දිවා කාලය පෙ.ව.7.00 සිට ප.ව. 5.00 දක්වා | රාත්‍රී කාලය ප.ව.6.00 සිට පසුදා අළුයම 2.00 දක්වා | දිවා රාත්‍රී දෙකට පෙ.ව.7.00 සිට පසුදා අළුයම 2.00 දක්වා |
| 09. | සැණකෙලි,සංගීත ප්‍රසංග,වෙළඳ ප්‍රදර්ශන,ආගමික හා සංස්කෘතික වැඩසටහන්, විශේෂ වැඩසටහන්, රැස්වීම් සඳහා | රු. 30,000.00 | රු. 40,000.00 | රු. 60,000.00 |
| ඇප තැන්පතු - ක්‍රීඩාපිටිය සඳහා ගෙවන මුදල මෙන් 5 ගුණයක් ඇප තැන්පතුව ලෙස තිබිය යුතුය. | | | | |

❖ එබැවින් ක්‍රීඩාංගනය ලබාදීම වෙනුවෙන් දෛනික ගාස්තු අයකිරීම පහත සඳහන් පරිදි වේ.

| අනු. අංකය | කාරණය | මුදල් අයකිරීම | |
|---|---|---|---|
| | | ක්‍රීඩාංගනය සඳහා | |
| | | දිවා කාලය පෙ.ව. **7.00** සිට ප.ව. **7.00** දක්වා | රාත්‍රී කාලය ප.ව. **6.00** සිට පසුදා පෙ.ව. **6.00** දක්වා |
| 10. | සැණකෙලි හා සංගීත ප්‍රසංග සඳහා ලබා දෙන්නේ නම් පමණක් | දෛනික ගාස්තු රු. 7,500.00 තැන්පත් ගාස්තු රු. 1,250.00 | දෛනික ගාස්තු රු. 12,500.00 රු. 1,250.00 |

*සැ.යු.* –

තැන්පතු වශයෙන් අය කරන මුදල තරග අවසානයේදී ක්‍රීඩාංගන භාරකරුගේ වාර්තාව අනුව ක්‍රීඩාංගනය සඳහා යම් කිසි අලාභහානියක් සිදු වී නොමැති නම්, තැන්පත් කළ මුළු මුදලම ආපසු ගෙවීමටත්, අලාභ හානියක් සිදුවුයේ නම් අලාභය ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරියෙකු ලවා තක්සේරු කර එම මුදල තැන්පත් මුදලින් අඩු කරගෙන ඉතිරි මුදල ආපසු ගෙවීමටත්, තැන්පතු මුදලට වඩා වැඩි අලාභයක් සිදුවුයේ නම් කාර්මික නිලධාරි වාර්තාව අනුව අදාළ පාර්ශවය වැඩිපුර වන මුදල සභාව වෙත ගෙවීමට බැඳී සිටිය යුතුයි.

18. කොම්පෝස්ට් පොහොර අලෙවි කිරීම

කොම්පෝස්ට් පොහොර **1kg** ක මිල රු. 15.00 කි.

**100kg** ට වැඩි මිල දී ගැනීමක දී වැඩිවන සෑම **1kg** ක් රු. 12.00 බැගින් **1000kg** දක්වාද

**1000 kg** ට වැඩි මිලදී ගැනීමක දී වැඩි වන සෑම **1kg** ක් සඳහා රු. 10.00 බැගින් ද මිල නියම වේ.

( **1kg** -100 **kg** දක්වා **1kg**ක් රු.15.00 බැගින්)

(101 **kg** -1000 **kg** ක් දක්වා **1kg**ක් රු. 12.00 බැගින්)

(1001 **kg** සිට ඉහලට 1 **kg**ක් රු. 10.00 බැගින්)

19. ආදාහනාගාරය හා සුසාන භූමි ලබාදීම වෙනුවෙන් ගාස්තු අය කිරීම පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. | බල ප්‍රදේශය තුළ පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | රු. 12,000.00 |
| 02. | බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීමට | රු. 14,000.00 |
| 03. | භූමි දාන ගාස්තු | රු. 200.00 |

20. මාර්ග පළුදු කිරීම් වෙනුවෙන් ගාස්තු අයකිරීම පහත පරිදි වේ.

මාර්ග පළුදු කිරීමට අවසර ලබාදීමේ දී රු. 3,500.00 ක ඇප තැන්පතු මුදලක් ගෙවිය යුතු අතර, ආපසු නොගෙවන ගාස්තුවක් වශයෙන් රු. 1,500.00 ක මුදලක් ගෙවිය යුතුය.

21. පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු අයකිරීම සම්බන්ධව පහත සඳහන් පරිදි ගාස්තු පැනවීම.

- අලුතින් කර්මාන්තයක් ආරම්භ කරන විට දී සහ බලපත්‍රය අලුත් කිරීමක දී මූලික ආයෝජනය මත පාදක වූ සංශෝධිත පරීක්ෂණ ගාස්තුව :

| *මූලික ආයෝජනය (රු.)* | *ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව (රු.)* |
|---|---|
| රු. 250,000/- ට අඩු | 3,000/-+ රජයේ අනුමත බදු |
| රු. 250,001/- සිට රු. 500,000/- දක්වා | 3,750/-+රජයේ අනුමත බදු |
| රු. 500,001/- සිට රු. 1,000,000/- දක්වා | 5,000/-+ රජයේ අනුමත බදු |
| රු. 1,000,001/- ට වැඩි | 10,000/-+ රජයේ අනුමත බදු |

- පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව :

| | | |
|---|---|---|
| බලපත්‍ර ගාස්තුව | රු. 4500/- | වසර 3 ක් හෝ ඊට අඩු කාලයක් (වලංගු කාලය) |

- නියමිත දිනට බලපත්‍ර අලුත් කිරීමේ දී ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව අය නොකෙරේ. (බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවීමට පෙර)

- නියමිත දිනට දිනක් හෝ ප්‍රමාද වී අයදුම් කරන විට දී (බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවූ පසු) මූලික ආයෝජනය මත පදනම්ව අදාළ පරීක්ෂණ ගාස්තුවෙන් 50% මුදලක් අය කෙරේ.

| *අයදුම්පත්‍රය* | *ගාස්තුව (රු.)* |
|---|---|
| 1. අලුතින්ම පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීම සඳහාවන අයදුම්පත | 150.00 |
| 2. පරිසර ආරක්ෂණ බලපත්‍රය වසර 3 කට වරක් අලුත් කිරීමේ අයදුම්පත් ගාස්තුව | 100.00 |

12 - 443/8

---

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු අයකර ගැනීම

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්, පී. ආර්. පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 154(1) වැනි උප වගන්තිය ප්‍රකාරව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරි වශයෙන් 2025 වර්ෂයට අදාළව ඉඩම් විකිණීම මත බදු පැනවීම සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**තීරණය**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ පාලන සීමාව තුළ තිබෙන යම් ඉඩමක් වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 1% සමාන බද්දක් විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයින් හෝ නියෝජිතයා විසින් රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.(මෙම බද්ද ගෙවීම අදාළ වර්ෂය අවසානයට පෙර ගෙවිය යුතු බවත් මෙම බද්දට අමතරව රජය විසින් පනවනු ලබන බදු අය කරනු ලැබේ.)

12 - 443/9

## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

### 2025 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් /ආශ්‍රය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් , පී.ආර්.පතිරණ වන මා විසින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 122 හා 126 වැනි වගන්තිවලට අනුකූලව 261 ක් වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ විධිවිධාන ප්‍රකාර විෂය භාර අමාත්‍යවරයා විසින් 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ ප්‍රකාශයට පත්කර ඇති 39 අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යය, කර්තව්‍ය, ක්‍රියාත්මක කරන නිලධාරී වශයෙන් 2025 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම්/ආශ්‍රය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සම්බන්ධයෙන් පහත සඳහන් තීරණය වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 22 වැනි දින තීරණ අංක 19 යටතේ ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

පී.ආර්.පතිරණ,
ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

2024 නොවැම්බර් මස 22 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභා කාර් යාලයේ දී ය.

#### තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වන වගන්තියේ මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වන දින අංක 520/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/ආශ්‍රය පරිසර පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියක, පාරක, ඇලකට, වැවකට, මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුවක් 2025 වර්ෂයේ සිට අය කිරීමට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව වෙනුවෙන් තීරණය කරමි.

#### *උපලේඛනය*

| | | (රු. ශත) |
|---|---|---|
| 01. | බිත්තියක හෝ පුවරුවක හෝ ලෑල්ලක හෝ ලී හෝ ගැල්වනයිස් බට යොදා හෝ කොන්ක්‍රීට් කණු යොදා සවි කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට වසරකට | රු. 100.00 |
| 02. | රෙදි මත සිත්තාරු කරන ලද හෝ ඩිජිටල් මුද්‍රණ සකසන ලද වෙනත් ඕනෑම බැනරයක් ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් සෑම වර්ග අඩියක් සඳහා මාසයක් හෝ ඉන් කොටසක් සඳහා | රු.50.00 |

12 - 443/10